# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2311/34 – 2022 දෙසැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා – 2022.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බ්ලූමැන්ඩල් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බ්ලූමැන්ඩල් (කොට්ඨාස අංක 6- බ්ලූමැන්ඩල් කොළඹ මහනගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/COL/2020/416 හා 2020.10.13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 01 – 312 වත්ත (කොටසක්) – ප්‍රමාණය: හෙක්. 0.0924**

උතුරට: ඇළ; නැගෙනහිරට: ඇළ සහ සිරිල් සී. පෙරේරා මාවතේ වරිපනම් අංකය සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම; දකුණට: සිරිල් සී. පෙරේරා මාවතේ වරිපනම් අංකය සහ හිමිකරු සොයා ගත නොහැකි ඉඩම සහ නාගරික සංවර්ධන අධිකාරිය හිමිකම් කියන 312 වත්ත; බටහිරට: නාගරික සංවර්ධන අධිකාරිය හිමිකම් කියන 312 වත්ත සහ ඇළ.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/16/2018/UDA/470.
2022 ජුනි මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 12 – 0278